# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/14/SS/2VII/3/2025-2 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2025.11.26 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂවරුන් /සහකාර සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන්,
සියළුම විෂය භාර නිලධාරින් / සමෘද්ධි සංවර්ධන නිලධාරින්,

**අස්වැසුම ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලැබූ සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල උසස් පෙළ හදාරන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහනට අදාලව වාරික මුදල් සෘජු ප්‍රේෂණ මඟින් සමෘද්ධි බැංකු හරහා ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම් වලට බැර කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි චක්‍රලේඛ නිකුත් කර ඇත.

i.2025.07.19 දිනැති සමෘද්ධි චක්‍රලේඛ 2025/10 - සමාජ ආරක්ෂණ හා සුභසාධන
ii.2025.09.02 දිනැති සමෘද්ධි චක්‍රලේඛ 2025/11 - සමාජ ආරක්ෂණ හා සුභසාධන
iii.2025.09.15 දිනැති සමෘද්ධි චක්‍රලේඛ 2025/11 - සංශෝධන - සමාජ ආරක්ෂණ හා සුභසාධන
iv. 2025.09.23 දිනැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2025/13 - ක්ෂුද්‍ර මූල්‍ය
v.2025.10.03 දිනැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2025/13 පළමු සංශෝධනය - ක්ෂුද්‍ර මූල්‍ය

02. ඒ අනුව ප්‍රතිලාභ හිමි වීමට සුදුසුකම් ලබන ප්‍රතිලාභී දරුවන් පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලය වෙත එවනු ලබන අතර, ඒ මත පදනම්ව මාර්ගස්ථ ක්‍රමවේදය ඔස්සේ වාරික මුදල් බැංකු වෙත ප්‍රේෂණය කරනු ලබයි.

03. මෙම ක්‍රියාවලියට අනුව බැංකු වෙත ප්‍රේෂණය කරන මුදල් සියල්ල ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම් වෙත වහාම බැර විය යුතුයි. ඒ අනුව මේ වන විට සැප්තැම්බර්, ඔක්තෝබර් සහ ඉල්ලුම් කර ඇති දිස්ත්‍රික් සඳහා නොවැම්බර් මසට අදාලවද මාර්ගස්ථ ක්‍රමවේදය ඔස්සේ වාරික මුදල් බැංකු වෙත ප්‍රේෂණය කර ඇත.

04. එහෙත් ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුමට මෙම මුදල් බැරවීමේ ප්‍රමාදයක් පවතින බවට කරුණු අනාවරණය වී ඇත.තවද මුදල් බැර කිරීම සම්බන්ධයෙන් 2025.09.23 දිනැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ 2025/13 මඟින් කේත අංක 4069 හඳුන්වා දී ඇතත් සමහර බැංකු මඟින් එම කේත අංකය උපයෝගී කර ගෙන නොමැති බවද වාර්තාවේ. එබැවින් සමෘද්ධි බැංකු මඟින් අදාල ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම් වෙත වාරික මුදල් බැර වී ඇති බව බැංකු මට්ටමින් ලබා ගන්නා තහවුරුව සහතික කර හා එම වාර්තාව අනුව යම්කිසි විශේෂ හේතුවක් මත ප්‍රතිලාභී දරුවන්ගේ ගිණුම් වෙත මුදල් බැර කිරීමක් සිදු නොකරන බවට අනාවරණය වුවහොත් එයට හේතුව සඳහන් කර සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශයේ විද්‍යුත් තැපැල ssfsamurdhi@yahoo.com වෙත නොපමාව යොමු කරන මෙන් ද කාරුණිකව දන්වමි.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

05. තවද මේ අවස්ථාවේ දී 2023/2025 අධ්‍යයන වර්ෂයේ අ.පො.ස.උසස් පෙළ විභාගය 2025 දෙසැම්බර් මස 06 වන දින තෙක් පැවැත්වේ. එබැවින් එම අධ්‍යයන වර්ෂයේ 2025 දෙසැම්බර් මසට අදාලව ද වාරික මුදල් ඉල්ලුම් කරන ලෙසට ද කාරුණිකව දන්වමි.

**06. 2025/2027 නව අධ්‍යයන වර්ෂය සඳහා මුදල් ගෙවීම**

06.i 2025/2027 නව අධ්‍යයන වර්ෂය සඳහා සිප්දොර ශිෂ්‍යත්වලාභී සිසුන් සඳහා 2025 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් මස දක්වා කඩිනමින් හිඟ වාරික මුදල් සමෘද්ධි බැංකු වෙත ප්‍රේෂණය කිරීමට අවශ්‍ය බැවින් 2025.09.02.දිනැති 2025/11 සමාජ ආරක්ෂණ හා සුභසාධන චක්‍රලේඛයේ ඇමුණුම් අංක 02 පරිදි මාසිකව මුදල් ඉල්ලුම් කළ යුතුය.

06.ii. තවද දෙසැම්බර් මස මුදල් ඉල්ලුම් කිරීමේ දී අධ්‍යයන වර්ෂ 3 ම ඇතුලත්කර සමෘද්ධි බැංකු මට්ටමින් පිළියෙල කර ප්‍රධාන කාර්යාලයෙන් ඔබ වෙත එවන ලද EXCELL ආකෘතිය බාගත කර එම ආකෘතියට 2023/2025, 2024/2026 දෙසැම්බර් මස වාරික මුදලද ,2025/2027 අධ්‍යයන වර්ෂයේ අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා වාරික එකතුවද ඇතුලත් කර දෙසැම්බර් මස මුදල් ඉල්ලුම් කරන ලෙස කාරුණිකව දන්වමි.

සී.ඩී. කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ, (ක්ෂුද්‍ර මූල්‍ය) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.අ.ක.ස.
3. සහකාර අධ්‍යක්ෂ, (තොරතුරු තාක්ෂණ), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.අ.ක.ස. හා දැ.ගැ.ස.
5. අනෙකුත් සියළුම අංශ ප්‍රධානීන් - කා.දැ.ගැ.ස.